

**රත්න ශ්‍රී විජේසිංහ**

සමාජ පංතීන්ගේ සම්මතය ප්‍රශ්න කරන කවියා, වෘත්තීන්හි සැබෑ ධාර්මික තාවද ප්‍රශ්න කරයි. බුදුන් දවස සුනීත මෙන් සිදු කෙරෙන ඔහුගේ දෛනික රැකියාව කවියාගේ ළතැවුලට හේතුවේ.

# විමලරත්න කුමාරගම

## නැවත කියැවීම 3



විමලරත්න කුමාරගම 1942 දී ලියූ ලිපියකින්



**ගන්තුන තුලානේ, අලියා වැටුන වැවේ සුන්දර හාමිගේ කතා පුවත දිගහරින 'කවුද ගෙදර' නම් තරමක් දිගු රචනය එම කැලෑගම්වල දිළිඳු ගොවීන්ගේ නියෝජනාත්මක මුහුණුවරයි.**

'යන්තම් බේරුණා' නම් කවි පෙළ ද මුව දෙනකගේ ඝාතනයත්, ඉන්පසු සිදුවන ක්‍රියාවලියන් පිළිබඳ අත්දැකීම් ඔස්සේ රචිතය. කවියා නාමින් සිටියදී ඔහුට වෙඩි හඬ ඇසේ. තෙත පිටින් ම ගෙය දෙසට දිවයන ඔහුට දැක ගන්නට ලැබෙන්නේ වැට ළඟ නාඹර මුව දෙනක සෙමින් මියයමින් ඉන්නා අයුරුය. කටුකම්බියට ඇගේ සම සීරී ඇත. වැදි කොලුගේ වෙඩිල්ලෙන් බේරී ගිය නුහුණු ඇගේ මළ බුරුල්ලෙන්කිරි වැගිරෙයි. කෑම් බීම් හිඟ මේ වන ගත පරිසරයේ දී නිර්මාංශ භක්ෂක උග්‍ර අවිහිංසාවාදියකු නොවන කවියා අව්‍යාජව සිත් සිතිවිලි හෙළි කරනනේ ඉක්බිතිවය.

මිරිසට උයා තිබූ ඇගෙ මස එදින　　රැයේ  
මට කිරි රසට වැටහුණ බව මතක　　තියේ  
මුළු රෑ මසිත මව නැති දරු වෙතය　　ගියේ  
මම නිදිගතිමි පසු දින හිරු නැගෙන　　පැයේ  
(යන්තම් බේරුණා)

ඔහු හිරු නැගෙන තුරුම නිදි වරමින් දුන් දුක්වන්නේ මිය ගිය මව ගැන නොව මව නැති දරුවන් ගැනය. ඉන්පසු දිනෙක මව නැති පැටවුන් පිඹුරකුට... ගොදුරු වන්නට ගොස් ගලවා ගනු ලැබේ. මවක අහිමි කරුවන්ට මුහුණ දෙන්නට සිදුවන අතවර කෙතරම් ද?

ඉර පායා ඉර මුදුනට එන්ට　　එපා  
හඳ පායා හඳ මුදුනට එන්ට　　එපා  
දිවි නරි පිඹුරු කටකට අසුවෙන්ට　　එපා  
අම්මා නැති අපට බඩගිනි වෙන්ට　　එපා  
(යන්තම් බේරුණා)

කවියාගේ එම පැතුම අම්මා නැති සමස්ත සමාජයම වෙනුවෙන් නොවේ ද? 'කිරා' ද අම්මා නැති සමාජයේම දරුවෙකි. කිරා කවියා වෙත පමුනුවනු ලබන්නේ, ඔහුගේ මව ද ඝාතකයින්ට ගොදුරුව අසරණ වීමෙන් පසුවය. කිරා කවියා ළඟ සුරක්ෂිතව වැඩෙයි. උගේ නාඹර හිසින් මතුවන අං, කවියාට සිහිපත් කොට දෙන්නේ උගේ සංවේගදායි අනාගතයයි. දඩබ්බර තරුණ කම් හීලෑ කරන්නට ඉක්බිතිව කිරාගේ ගෙලවටා රැහැනක් පැටලේ. උගේ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කනස්සල්ලට පත්වන කවියා මෙසේ කියයි.

ලෝකයෙ පිනිස ළඟ පියවිය යුතුය　　නෙත  
කඳුළැලිවලින් වෙයි මට මුළු ලොවම　　තෙත  
උඹ දැගලුවොත් ඕනෑවට වැඩිය　　පුත  
වෙඩි උන්ඩයක පිළිසරණක් නුඹට　　ඇත

ගෙල බිඳගතොත් මේ සිරගෙය තුළදි　　ඉබේ  
වැදගත් විලස වළ දැමුමත් උඹට　　තිබේ  
නිදහන් කළොත් ඇටකටු යම් මඩක　　උඹේ  
ගිනි කඳු මට දැනුදු මට සිහිනෙන් පෙනෙනු　　ලැබේ  
(කිරා)

තාරුණ්‍යයෙන් ඔදවැඩී කලබලව හැසිරෙන පුතකුගේ ඉරණම පිළිබඳව මර්දනයෙන් සන්නද්ධ ලෝකය හමුවේ තැවෙන පියකුගේ හඬ මිස, 'කිරා' නම් මුව පෙව්වකුගේ භාරකරුවකුගේ කටහඬක් මින් හැඟෙන්නේද?
වියළි කලාපයේ වන්නි හත්පත්තුවේ නොදියුණු කැලෑ ගම්වල කුමාරගම කවියාට සැරිසරන්නට සිදු වූ ඔහුගේ රාජ්‍ය සේවා කාලය, ඉහත දී මුණ ගැසුණු සතා සතුන් මෙන් ම කිසිදා මුණ නොගැසුනු මිනිසුන් හා ගැහැණුන් ද මුණ ගැස්වීය. සිංහල කවියට එතෙක් නොපිවිසි, කිසිදු කවියකුට හමු නොවූ එකී මිනිස්සු කුමාරගමගේ සිතිවිලි හා කවියේ හැඩතල වෙනස් කළහ. 'සවේග වේදනා' හා 'නිල් වනය' වැනි ගතානුගතික හා සාම්ප්‍රදායික කවි මඟකින් බැහැර කොට යථාර්ථවත් ලෝකයකට ඔහුගේ කවිය ගෙන ගියේ ඒ මිනිස්සුය.
'කවුද ගෙදර', හේරත් හාමි, ආරච්චි රාළ, වන්නියේ දොස්තර, සෝවිස්, වැනි එකී චරිත වනගත නොදියුණු ගම්වල ජීවිතයේ දිග පළල කදිමට කියාපායි. අයියනායක වැනි රචනයකින් හෙළිවන්නේ එම ජනතාවගේ ආධ්‍යාත්මයයි.

ගන්තුන තුලානේ, අලියා වැටුන වැවේ සුන්දර හාමිගේ කතා පුවත දිගහරින 'කවුද ගෙදර' නම් තරමක් දිගු රචනය එම කැලෑගම්වල දිළිඳු ගොවීන්ගේ නියෝජනාත්මක මුහුණුවරයි. මුල් වරට කවියා මුණගැසුනු දා සුන්දර ගැමි ඔහුට තැඹිලි ගෙඩියක් පිළිගන්වා හිතවතකු ලෙස ඔහු හා පිළිසඳරකට එන්නේ ආධ්‍යාත්මිකව නොදිළිඳු ගැමියන් ස්වභාවය පෙන්වා දෙමිනි.

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි　　වත්තේ  
දුප්පත් කමයි හැම තැන ලකුණුම　　ඇත්තේ

කවියා සුන්දර හාමිගේ වත්කම් ප්‍රමාණ කරයි. ඔහුට උණ ගෙඩි වලින් බඩ ගෙඩි ඉදිකටු දරුවෝ දෙදෙනෙකි. අන්ධ වූ තවත් කුඩා දියණියකි. නිසි අහරක් නොලැබීමෙන් දෑසේ සුද මතුවී මේ අනාගත පරපුර ලොව නොදැක ගියේ වන.

අසලක නොවේ ඇතතේ දොස්තර　　ගෙදර  
තුන් ගව්වකට ඈතය කුවිනින්　　වතුර  
හිම මැද මෙගම හා ළඟ පාසල　　අතර  
සැතපුම් දහතුනයි පවතින දුරු　　කතර  
(කටු ගෙදර)

ගැමියන්ට ලැබෙන සුව සේවාවේ හා අධ්‍යාපනයේ තරම එබඳුය. මැලේරියාව ඔවුන්ට දිගට හරහට පහර දෙයි. එහෙයින් ම කුඹුරු පුරන් වේ. දඩ වදී. හේන ද නියඟයෙන් පාළු වේ. ඒ අතර ණය බර විසින් උපයන සොච්චමද පැහැර ගනී.

කාදර සයිබුගේ කඩයෙන් ණයට　　කියා  
ගත් ලුනු මිරිස් කරවලවල ගණන　　ලියා  
ඊළඟ කන්නයේ කොළදින් දවස හොයා  
කාදර ඇවිත් මුට බැත ගොඩ අරන්ගියා  
(කටුගෙදර)

කෙමෙන් ගමට පිවිසෙන ධනේශ්වර ක්‍රමයේ වියගසට ඔවුන්ගේ ගෙල හිරවෙමින් තිබේ. සොබා දහමද, වනසත්තුද, තවදුරටත් ඔවුන්ට එරෙහි වෙති. ලෙනාඩ් වුල්ෆ් දුටු බද්දේගම ගම්මානයේ වැසියන් මෙන් මොවුහුද ඉහත කී දහසක් අතෝරයන් විසින් ගිලගනු ලබති. කෙටි කාලයක් තුළදී පවුල් විස්සක් පමණ වූ ගම පවුල් හයකට සීමාවේ. සමසකට පසු සුන්දරහාමි සොයා යන කවියා ඔවුන්ගේ ඉරණම මෙසේ සටහන් කරයි.

ඊජිප්තුවේ මළවුන්ගේ අකුරු　　වැනී  
වේ පස් තිබේ බිත්තියේ හැම තැනම　　වැනී  
දොර ගැට ගසන ලද වරමදු සෙට　　ඉනී  
කවුරුද ගෙදර තොප හැර කළු　　කුහුඹුවනී

ලිග්ගල් අතර අබ පැල තුන කරල්　　ගනී  
පුස් කෑ හාල් ඇතිලි මළ හිස් කබල්　　වැනී  
වහලේ හිල්වලින් යන්තම් එළිය　　දුනී  
කවුරුද ගෙදර තොපහැර කළු　　කුහුඹුවනී  
(කවුද ගෙදර)

සුන්දර හාමි අලියාවැටුනු වැව ගමේ ගොවියකු වූ සේම හේරත් හාමි එගමේ කම්කරුවෙකි. ඒ හැරුණු විට මරණ වර්ෂාණවලදී හේ කාය ව්‍යවච්ඡේදනයෙන් සහාය වෙයි.

අලියා වැටුනු වැව සිටි හේරත්　　හාමී  
මා වැනියකු වුවද මම වැදගත්　　වීමි  
මිනී කපන මුත් ඒ හේරත්　　හාමී  
ඔහු මට වඩා විසිතිස් ගුණයෙන්　　දැමි  
(හේරත් හාමි)

සමාජ පංතීන්ගේ සම්මතය ප්‍රශ්න කරන කවියා, වෘත්තීන්හි සැබෑ ධාර්මික තාවද ප්‍රශ්න කරයි. බුදුන් දවස සුනීත මෙන් සිදු කෙරෙන ඔහුගේ දෛනික රැකියාව කවියාගේ ළතැවුලට හේතුවේ.

මා වැනියකුට මඳ සංවේගයම　　දිදී  
හැමදා උදේ ඔහු මගෙ වැසිකිළිය　　අදී  
හදිසියෙ යමකු මළහොත් දොස්තරද　　වදී  
අප ඉදිරියේ එහු මළකුණ කපන　　ලදී  
(හේරත් හාමි)
අර්ධ ගොවි කම්කරුවකු වන හේරත් හාමි සතු මිනිස්කමේ සරුසාරත්වය සින්දවා මුළුමනින් බිඳහෙළන්නට ඔහුගේ වෘත්තීය පරත්වාරෝපණයට නොහැකි වී ඇති වග කවියා නිරීක්ෂණය කරන්නේ අතිසියුම් අයුරිනි.

අවනත සිනා රැළි වත නිතරම　　පතුරයි  
හැමදා වදනක්ම අවිහිංසකවම　　මතුරයි  
හැම දා වගේ හවසට බොන ගිනි　　වතුරයි  
ඔහුගේ පපුව දැඩි කරුණාවෙන්　　උතුරයි  
(හේරත් හාමි)

මතු සම්බන්ධයි

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ